www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ධනවාදයේ ලෝක අර්බුදය හා සමාජවාදය සඳහා ඉදිරි දැක්ම

## පස්වෙනි කොටස

**The world crisis of capitalism and the prospects for socialism**
**Part five**

**නික් බීම්ස් විසිනි**
**2008 පෙබරවාරි 03**

*පහත පලවන්නේ ජනවාරි 21 සිට 25 දක්වා ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නුවරදී හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව හා සමාජ සමානතාවය සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ විසින් පවත්වන ලද ජාත්‍යන්තර පාසැලට නික් බීම්ස් විසින් ඉදිරිපත්කරන ලද ආරම්භක වාර්තාවේ පස්වෙනි කොටස යි. බීම්ස් ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සාමාජිකයෙක් වන අතර ඕස්ට්‍රේලියානු සමාජවාදී සමානතා පක්ෂයේ ජාතික ලේකම්ය.*

අපගේ ඉදිරි දර්ශනය වර්ධනය කිරීමේදී ලා මෙම විශ්ලේෂනයේ ඇඟවුම් කවරේද?

1992 පටන් ධනේශ්වර සංවර්ධන වක්‍රයේ ඉහල නැඟී වර්ධනය වී තිබීමෙන් ඇඟැවෙන්නේ සමාජවාදී විප්ලවය අවිනිශ්චිතව නොවේ නම්, අවම වශයෙන් මතු දැකිය හැකි අනාගතය උදෙසා වත්, න්‍යාය පත්‍රයෙන් ඉවත් කරනු ලැබ ඇති බවද?

නො එසේ නම් අනෙක් අතට මෙම ඉහල නැඟීමේ ප්‍රගතිය ම ලෝක ධනේශ්වර පද්ධතිය තුලට දේශපාලන කලබැගෑනියේ හා විප්ලවවාදී අරගලයේ නව අවධියක් සඳහා වෛෂයික පදනම් දමන්නා වූ නව ආතතීන් හා ප්‍රතිවිරෝධයන් ඇතුලත් කරයි ද?

පලමු කොට ම ධනේශ්වර සංවර්ධන වක්‍රයේ ඉහල නැඟීමක් සමාජවාදී විප්ලවය බැහැර නොකරන බව සටහන් කර ගනිමින් ම අපි මෙම ප්‍රශ්නය පිලිබඳ අපගේ විශ්ලේෂනය, ආරම්භ කරමු. එයට ප්‍රතිකූලව 1914 ප්‍රථම ලෝක සංග්‍රාමය හා 1917 රුසියානු විප්ලවය එලඹුනේ 1890 ගනන් මැද හරියේ ආරම්භ වූ ධනේශ්වර සංවර්ධන වක්‍රයේ ඉහල නැඟීම අවසන් කරමිනි. ආර්ථික පුනර්ජීවන ක්‍රියාවලිය ආරම්භයේදී ම එහි වෙනස්කම් දැක ගත් බර්න්ස්ටයින්, විප්ලවය තවදුරටත් ශක්‍ය ඉදිරිදර්ශනයක් නොවන බවත් සමාජවාදය බිහිවන්නේ ප්‍රතිසංස්කරන මාලාවක් හරහා පමනක් බවත් නිගමනය කලේය. මෙම ඉදිරිදර්ශනය කොතෙක් නම් සාවද්‍ය යයි තහවුරු වී ද?

එසේ ම වෙනස් නායකත්වයක් තිබුනි නම් අතිශය සහතිකව සමාජවාදී විප්ලවයට තුඩුදිය හැකිව තිබූ 1968-75 වකවානුවේ කම්කරු පන්ති නැගිටීම් එලඹුනේ ලෝක ධනවාදී ඉතිහාසයේ දීර්ග තම ඉහල නැඟීමෙන් පසුව ය. අප මීට පෙර ද සඳහන් කර ඇති පරිදි හරියටම එය පුපුරා ගියේ, අවම වශයෙන් දියුනු ධනපති රටවල දී වත් කම්කරු පන්තිය දැඩි ලෙස ධනේශ්වර පර්යාය තුලට ඒකාග්‍ර වී ඇති බැවින් ඔවුන් තවදුරටත් විප්ලවවාදී ක්‍රියාකලාපයක් ඉටු කිරීමට අසමත් යයි මාර්කියුස් වැනි නව වාමාංශයේ න්‍යායාචාර්යවරුන් විසින් නිගමනය කරනු ලැබූ අවධියේදී ම ය. එම ඉදිරිදර්ශනය ද තරයේ ම බංකොලොත් බව සනාථ විය.

ඉහත සඳහන් කරුනු ප්‍රකාශ කල පසුව, අපගේ වගකීම වන්නේ කිසියම් වර්ගයක වාගාලාප දෙඩවීම හෝ සරල ලෙස සෙස්සන් 'ඔවු' යොදන තැනට " නැත" යෙදීම හෝ නොව වෛෂයික තත්වයේ සිදුව ඇති වෙනස්කම් පිලිබඳව සාවධාන තක්සේරුවක් කිරීමත් ඒවායේ ඇඟවුම් විමසා බැලීම හා ඉන් පැනනනංවනු ලබන දේශපාලන වර්ධනයන්ට සූදානම් වීමත්ය.

අප සමාජවාදය සඳහා අරගලයේ මතු දැක්ම විභාග කිරීමේ දී ට්‍රොට්ස්කි වරෙක ධනේශ්වර සමතුලිතය ලෙස සඳහන් කලේ කුමක් දැයි පිරික්සා බැලිය යුතුය. ධනවාදය සමතුලිතයක් බිහිකරයි, ඉක්බිති එය බිඳ දමයි; එය යලිත් අලුතෙන් සමතුලිතයක් ගොඩ නගන්නේ එය ද යලි බිඳ දැමීම සඳහා ය යනුවෙන් ඔහු සටහන් කලේය. ඔහු ප්‍රධාන සාධක තුනක් පෙන්වා දුන්නේය. එනම් ආර්ථික ක්‍රියාවලීන්, පන්ති සම්බන්ධතාවයන් හා ධනේශ්වර රාජ්‍යයන් අතර සම්බන්ධතාවය යි. මෙහි දී ඒවා එකිනෙක අතර සිදුවන ප්‍රතික්‍රියා හා අන්තර් ක්‍රියාවන් සිහියේ තබා ගනිමින්ම අපි විශ්ලේෂනයේ කාර්යය සඳහා ඒ සෑම එකක්ම එකිනෙකින් වෙන්කර විභාග කර බලමු.

ආර්ථික ක්ෂේත්‍රයේදී පසුගිය වසර 15 පුරා අතිශයින්ම අස්ථාවර වාතාවරනයක් නිර්මානය කරනු ලැබ ඇති බව පැහැදිලිය: දියුනු ධනපති රටවල් බොහොමයක ආර්ථික ව්‍යුහයේ දුර දිග යන වෙනස්කම් ද සමඟ, සමහර කලාපයන්හි, චීනය සම්බන්ධ ප්‍රශ්නයේදී මෙන් අස්ථාවර පදනම් මත වුවත්, වේගවත් ආර්ථික වර්ධනයක් ද, සිදු වී ඇත.

ඇමරිකාව තව මත් ඉතා ම බලගතු ජාතිය මෙන්ම ලොකු ම තනි වෙලඳපොල ද වන නමුත් තමන් මුහුනපා සිටින ගෙවුම්ශේෂ හිඟය පියවා ගැනීම සඳහා අවශේෂ ලෝකයේ ඉතිරි කිරීම් වලින් සියයට 75 ක් තරම් විශාල ප්‍රමානයක් ඇද ගැනීමට එයට සිදු වී තිබේ. අප 1987 කොටස් වෙලඳපොල බිඳවැටීම තෙක් වසර 20 ආපසු යන්නේ නම් ඒ කාලය තුල ඇමරිකානු ආර්ථිකය පවත්වා ගෙන ගොස් ඇත්තේ වත්කම් බුබුල් මාලාවක් නිර්මානය කිරීම මගින් ය. මෙය දැන් මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වයට බරපතල තර්ජන එල්ල කරන අවධියකට එලඹ ඇත යන්න පැහැදිලි වනු ඇත.

1980 ගනන්වල ආරම්භ කර 1990 ගනන්වල සිට අද දක්වාත් පවත්නා ගෝලීය ක්‍රියාවලියේ මාධ්‍යයන් මගින් වේගවත් කැරුනු ප්‍රතිව්‍යුහකරනය ඇමරිකානු ධනවාදයේ මුහුනුවර වෙනස් කර ඇත. 20 වන සියවස තුල ඇමරිකානු ධනවාදයේ නැඟීම අන් සියල්ලටත් වඩා බැඳී තිබුනේ නිෂ්පාදන කර්මාන්තයේ එය සතුව පැවති ආධිපත්‍යය සමග ය. කෙසේ වුවද, 20 වන සියවස අවසන් වන විට එක්සත් ජනපද ආර්ථිකයේ සියයට 14.5ක් වූ, නිෂ්පාදනයට සාපේක්ෂව මූල්‍යය, රක්ෂන, ඉඩම් හා දේපල (ෆයර් -ගින්දර) අංශය සියයට 20 කට වගකීවේ ය.

කෙවින් ෆිලිප්ස් සිය *American Theocracy* 'ඇමරිකානු පූජක තන්ත්‍රය' නමැති කෘතිය තුල මෙසේ ලියයි. "1990 ගනන් මැද භාගයේ දී මූල්‍ය අංශයේ ලාභ ඉක්මවා, නිෂ්පාදනයේ ලාභ වැඩී ඉක්බිති තව දුරටත් වැඩී ලියේ ය. 2004 වන විට එක්සත් ජනපදයේ ලාභවලින් සියයට 40 ආසන්න ප්‍රමානයක් තමන් සතු යයි දැරිය හැකි තත්වයකට මූල්‍ය ආයතනයෝ පත්ව සිටියාහ. එම වසරේ ඇමරිකානු කොටස් වෙලඳපොල ප්‍රාග්ධනයෙන් හතරෙන් එකක් මූල්‍ය ආයතන සතු විය. එය 1980 දී යාන්තම් සියයට 6 සිට 1990 දී සියයට 11 හා ඉන් ඔබ්බට ගිය වැඩි වීමකි.

ඓතිහාසිකව මෙම පරිවර්තනය දරා සිටින්නේ සිවිල් යුද්ධයෙන් පසු දශකයන්හි කෘෂිකර්මය පසෙකට ලමින් දුම්රිය මාර්ග, යකඩ හා වානේ අංශවල නැඟීජ්ම තරම්ම දැවැන්ත වැදගත් කමකි." (කෙවින් ෆිලිප්ස්, *American Theocracy*, ඇමරිකානු පූජකතන්ත්‍රය පෙන්ගුවින්, 2006 පිටු 265-266 )

ඇමරිකානු ආර්ථිකය තුල සිදුවූ මෙම දැවැන්ත වෙනස්කම්, මූල්‍ය උද්ගමනය නිෂ්පාදන කර්මාන්තයට අනුරූපව සිදුවී යයි සරල ලෙසම අදහස් නොවේ; ඒවා මූල්‍ය පද්ධතිය ම ක්‍රියාත්මක වී ඇති ස්වභාවයෙහි ප්‍රගාඪ වෙනස්කම්වලට සම්බන්ධව පවතිත්.

පශ්චාත් යුද්ධ උත්පාත අවධියේ එක්සත් ජනපද මූල්‍ය ප්‍රාග්ධනය ලාභ උකහා ගත්තේ කර්මාන්තයට නය සැපයීම හා වෙනත් වානිජ්‍ය බැංකු ආකෘතීන් මෙන්ම 3-6-3 ආකෘතියට අනුව නිවාස සඳහා නය ද ය. (එනම් සියයට 3 පොලියට නය ලබාගෙන සියයට 6 පොලියට නයට දී සියයට 3 ක් සාක්කුවේ දමාගැනීම) සැපයීම තුලින්ය. ඒ වනාහී අතිරික්ත වටිනාකම් උපුටා ගැනීමත් මූල්‍ය ප්‍රාග්ධනය විසින් එම අතිරික්ත වටිනාකමෙන් කොටසක් අත්කර ගැනීමත් අතර සැලකිය යුතු ඍජු සම්බන්ධයක් පැවති තත්වයකි. එහෙත් දැන් පැන නැගී ඇත්තේ බෙහෙවින් වෙනස් යාන්ත්‍රනයකි. මෙම නව යාන්ත්‍රනයට අනුව සිදුවන්නේ දේපල වටිනාකම් වෙනස්වීම් තුලින් අතිරික්ත වටිනාකම් සමුච්ඡය වන අවස්ථාවේ දී මූල්‍ය ප්‍රාග්ධනය විසින් ලාභ, කෙලින්ම අත්කර ගැනීම නොවේ. ඒ වෙනුවට දැන් (ලාභය සාක්ෂාත් කර ගැනීමේ ක්‍රියාවලිය) සිදුවන්නේ මූල්‍ය වෙලඳපොලවල කටයුතු මගින් ය.

මෙම වෙනස සිදුවූයේ කෙසේ ද? කොටින් කිවහොත්, 1970 ගනන්වල දී ලාභ අනුපාතය පහත වැටීමත්, 1980 ගනන්වල දී ලාභානුපාතයේ සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගැනීමට නොහැකි වීමත් නිසා ය. වෙනත් වචනවලින් කිවහොත් ධනේශ්වර වක්‍රයේ පහලට පැද්දීයාම, කර්මාන්ත ව්‍යුහයේ වෙනස්කම් ඇති කොට කම්කරු පන්තියට එරෙහිව ප්‍රහාරයක් ද දියත්කලා පමනක් නොව මූල්‍ය ප්‍රාග්ධනය ප්‍රතිව්‍යුහගත කිරීම ද සිදු කලේය.

මෑත අධ්‍යයනයක් එම ක්‍රියාවලීන් පහත දැක්වෙන පරිදි ගෙනහැර දක්වයි.

"1980 ගනන්වල එක්සත් ජනපද වානිජ්‍ය බැංකුවල ඉපැයීම් පහල වැටීමෙන් පසුව තැන්පතු රැස්කිරීම හා කෙටිකාලීන නයදීම් පිලිබඳව බැංකුවලට පනවා තිබූ නෛතික සීමාවන් ඉවත් කරන ලදී; ඒ පුලුල් පරිමානයේ ප්‍රාග්ධන වෙලඳපොල කටයුතුවලට, විශේෂයෙන් ම මීට පෙර වානිජ්‍ය බැංකු කටයුතුවල දී දක්නට නොලැබුනු බාරකාර සමාගම් ගොඩනැඟීමට ඉඩ සැලසා දීම සඳහා ය."

1933 ග්ලාස්-ස්ටීගල් පනතේ 20 වන කොටසින් එවන් සම්බන්ධකම් තහනම්කර තිබූ නමුත් 1980 ගනන්වල එම නෛතික සීමාවන් ලිහිල් කල බව කතුවරයා සඳහන් කරයි.

"එබැවින් 1980 ගනන්වල ඉඩම් හා දේපල අර්බුයෙන් මතුව ආ බැංකු පද්ධතිය තවදුරටත් ප්‍රථමිකව සේවය කලේ ව්‍යාපාරික නය දීම් සඳහා නොවේ; එය බැංකු ආදායම් සඳහා ප්‍රධාන කොට ම ශුද්ධ පොලී අතිරික්තය මත තවදුරටත් රැඳී සිටියේ ද නොවීය. ඒ වෙනුවට එම ක්‍රමය පදනම් වූයේ බැංකුවේ දේපල වානිජ්‍ය අංශවලට ලාභ ඉපැයීමටත් --- බැංකු අනුබද්ධ සමාගම්වලට ගාස්තු හා කොමිස් ආදායම් ඉපැයීමටත් පැවති හැකියාව මතය.

මෙම ක්‍රමය 'උපදවා බෙදාහැරීම' නමින් දැන් හැඳින්වෙන නව බැංකු කටයුතු පෙලක් බිහිකර තිබේ. ඒවා තුල දී බැංකු, වත්කම් උත්පාදනය කිරීමෙන් ද ශේෂ පත්‍රයෙන් පිට අනුබද්ධ ආයතනය තුල රඳවා එම වත්කම් කලමනාකරනය කිරීමෙන් ද, නය සඳහා ඇපයට තැබිය හැකි සුරැකුම් බවට පත්කල මෙම වත්කම් ප්‍රථමයෙන් බෙදාහැරීමේ දී ඒවා රක්ෂනය කිරීම හා සේවා කිරීම මඟින් ද සිය ගාස්තු හා කොමිස් ආදායම උපරිම කර ගැනීමේ උත්සාහයක නිරතව සිටිති." ( *Cushions of Safety* "සුරක්ෂිත බවේ කොට්ටය" ජැන් ක්‍රීජල් මින්ස්කි , ලෙවී ආයතනයේ පොදු ප්‍රතිපත්ති සංක්ෂිප්තය නො. 93 2008, 10-11 පිටු.)

මෙම ආකෘතියේදී බැංකු සිය ලාභ උපයන්නේ තමන්ම උත්පාදනය කල වත්කම් අලෙවිකිරීමට ඒවාට ඇති හැකියාව මඟින් ය. එසේ නොමැතිව එම වත්කම් සිය නය ලේඛනයෙහි රඳවාගෙන පොලී අතිරික්තයෙන් (හෙවත් පැරනි ක්‍රමය වූ ... එම මුදල් නයට දීමෙන් ලබන පොලියත් අතර වෙනසින්-) ලාභ අත්කර ගැනීමෙන් නොවේ, -බැංකුව නයට ගන්නා මුදල් සඳහා ගෙවන පොලියත් නය දීමෙන් ලබන පොලියත් අතර වෙනසින්, "උත්පාදනය කර බෙදාහැරීමේ" අලුත් ක්‍රමය තුලදී නයට දෙන මුදල තීරනය කරන්නේ නයකර බෙදාහැරීමේ ශක්‍යතාව මඟින්ය. නව හා අවදානම වැඩි නය සඳහා මූල්‍ය වෙලඳපොලවලින් යෙදෙන පීඩනය වැඩිවන විට පහල පොලී අනුපාත පවතින තතු තුල මූල්‍ය වෙලඳපොල තුල රක්ෂිත නය මිලදී ගැනීම සඳහා ඇති ඉල්ලුම ඉහල මට්ටමකට ලඟාවෙයි.

අනෙක් අතට මෙම ක්‍රියාවලිය සඳහා ඒ සා තීරනාත්මක වන පහල පොලී අනුපාතික රාමුව රඳපවත්නේ නය ප්‍රසාරනය හමුවේ පවා උද්ධමනය පහත් මට්ටමක පවතින්නේ නම් ය. එවැන්නකට ඉඩකඩ ලැබුනේ චීනය, ඉන්දියාව හා පැරනි ස්ටැලින්වාදී තන්ත්‍රයන් ලෝක වෙලඳපොලට ඒකාග්‍රවීම තුලිනි.

අඩු උද්ධමන තන්ත්‍රය අවසානය කරා ලඟාවෙමින් තිබෙන බවට පැහැදිලි සලකුනු දැන් පහලවී තිබෙන අතර ආර්ථික ප්‍රතිපත්ති පරිපාලනයේදී මෙය බරපතල ගැටලු මතුකෙරයි.

පසුබෑමේ ප්‍රවනතාවන් හා මූල්‍ය අර්බුදයන් හමුවේ ඇදවැටීම වැලැක්වීමේ ලා හිටපු ෆෙඩරල් බැංකු සභාපති ඇලන් ග්‍රීන්ස්පෑන්ගේ ප්‍රියතම විධික්‍රමය වූයේ පොලී අනුපාත පහත හෙලා මූල්‍ය වෙලඳපොලවල් උසිගැන්වීමයි. එහෙත් උද්ධමනය ඉහලයාම දැන් ප්‍රධාන ගැටලු මතුකර තිබේ.

එක් අතකට ෆෙඩරල් බැංකු සභාපති බර්නන්කේ ජනවාරි 10 දින සිය කථාවෙන් අඟවා ඇත්තේ ආර්ථික පසුබෑම වැලැක්වීමට අවශ්‍ය ඕනෑම දෙයක් කිරීමට බැංකුව සූදානමින් සිටින බවය. එහෙත් අනෙක් අතට උද්ධමනකාරී පීඩනය වැඩිවෙමින් තිබේ. උද්ධමනය පිලිබඳ "අපේක්ෂා රැහැන් බිඳී යාමේ" ඕනෑම ප්‍රවනතාවක් "මිල ස්ථායීකරනය බෙහෙවින් සංකීර්න කලහැකිය; එපමනක් නොව අනාගත වර්ධනයේ අඩු ලුහුඩුකම් මඟහරවා ගැනීමේ ලා මධ්‍යම බැංකු ප්‍රතිපත්තියේ නම්‍යශීලීත්වය අවම කල හැකිය."

මෙය කෙටිකාලීන ගැටලුවක් නොවේ. මෑතදී ලියූ සිය චරිතාපදානය තුල ග්‍රීන්ස්පෑන් මෙසේ පැහැදිලි කලේය. චීනය ලෝක වෙලඳපොලට ඒකාග්‍රවීම මගින් ඇති කල අවධමනකාරී බලපෑම හේතු කොට ගෙන තමාට පොලී කපාහැරීම මගින් උද්ධමනකාරී බලපෑම් ඇති කෙරෙතැයි නොතැවී එසේ කිරීමට ඉඩ ලැබුනු බවය. මෙය වාසනාවකට මෙන් සිදු වූ දෙයක් වූ බව ද ඔහු කියයි. එහෙත් ඉන් පසු පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවල දී ඔහු පැහැදිලි කලේ වියදම් හා උද්ධමනකාරී පීඩනය අනිවාර්යයෙන්ම වැඩිවීමට පටන් ගන්නා බැවින් තමන්ට පසුව එන අයට ඒ වාසිය නොලැබෙනු ඇති බවයි.

පූර්ව අවධියේ පැවැති සාපේක්ෂ සමතුලිතය බිඳ දැමීමට දැන් මග පාදන්නා වූ ප්‍රමුඛ සාධක දැන් ආර්ථික පෙරමුනේ ක්‍රියාත්මකව ඇති බව පැහැදිලිය. මූල්‍ය ප්‍රතිපත්ති පිලිබඳව බලධරයන් මුහුනපා සිටින ප්‍රතිවිරෝධ, පසුගිය වසර 15 පුරා ශ්‍රමයේ හා ප්‍රාග්ධනයේ පිරිවැය පහත හෙලීම මඟින් ලාභානුපාතය ඉහල නැංවීමට උදව්වන ක්‍රියාදාමය දැන් ලිහිල් වෙමින් තිබෙන බවටත් ධනේශ්වර උද්ගමනය අවසානයකට පැමිනෙමින් තිබෙන බවටත් සලකුනක් වීමට හොඳටම ඉඩ ඇත.

දෙවන ප්‍රධාන ප්‍රශ්නය නම් ප්‍රමුඛ ධනේශ්වර බලවතුන් අතර සම්බන්ධතාවය යි. 2000 වසර සිට වර්ධනයේ පිම්මක් බවට පත්ව තිබුනු ලෝක ධනේශ්වර ආර්ථිකයේ උද්ගමනය ඇත්තවශයෙන්ම අතිශයින්ම අස්ථාවරකාරී ක්‍රියාවලියක් බව සනාථ වී තිබේ.

චීනය ද රුසියාව වැනි අනෙකුත් බලවතුන්ගේ නැඟී ඒම දෙවන ලෝක සංග්‍රාමයෙන් පසුව පිහිටුවන ලද සමතුලිතය කඩා බිඳ දමන්නේ, මෙයට පෙර අවධියක, 19 වන ශතවර්ෂයේ අගදී ජර්මනිය, ජපානය

සහ ඇමරිකා එක්සත් ජනපදය ඉස්මත්තට එමින් කලින් මහා බ්‍රිතාන්‍ය සහ ඇගේ ලෝක අධිරාජ්‍ය විසින් පිහිටුවා ගෙන තිබුනු ලෝක සමතුලිතය බිඳ දැමූ පරිද්දෙන් ම වත්මනේ දී දෙවන ලෝක සංග්‍රාමයට පසුව පිහිටුවන ලද සමතුලිතය බිඳ දමනු2 ලබමින් පවතී. එම කාරනයේදී ප්‍රතිඵලය වූයේ දශක තුනක යුද්ධයකි. නව රාජ්‍යන්තර සමතුලිතය අවසානයේදී පිහිටුවන ලද්දේ එක්සත් ජනපදයේ රැකවරනය යටතේ 1945 දීය. එය පදනම් කරන ලද්දේ හුදෙක් එක්සත් ජනපදයේ මිලිටරි ශක්තිය මත නොව සියල්ලට මත් වඩා එහි ආර්ථික උත්තරීතර භාවය මතය. දැන් එම රාජ්‍යන්තර ආර්ථික අධිකාරය ඛාදනය වී හමාරය. එක් කැපී පෙනෙන සංඛ්‍යා ලේඛනයකින් මෙය කැටි කොට දැක්වෙයි. ඇමරිකානු ආර්ථිකය ලෝක ආර්ථිකයට සමානුපාත වන්නේ 1940 තිබූ එම සමාන මට්ටමෙන් ම ය.

ඇමරිකානු අධිරාජ්‍යවාදය දැන් උත්සාහ කරමින් ඉන්නේ තමන්ට අහිමිවූ ආර්ථික ආධිපත්‍ය අත්කර ගැනීමත් එහි ගෝලීය තත්වය පවත්වා ගැනීමත් සඳහා මිලිටරි බලය යොදාගැනීමට ය. එක්සත් ජනපද මිලිටරිවාදය පුපුරා යාමේ ඓතිහාසික වැදගත්කම මෙයයි. ඉරාකය වනාහී හුදෙක් ගෝලීය ගැටුමක වඩාත් ලේ වැකි පෙරමුන පමනි. උත්තර ධ්‍රැවයේ පටන් මැදපෙරදිග, මධ්‍යම ආසියාව, අප්‍රිකාව, නැගෙනහිර යුරෝපය හා බෝල්කන් ප්‍රදේශ දක්වාම අධිරාජ්‍යවාදී බලවතුන් දෙදෙනෙක් හෝ වැඩි ගනනකගේ අවශ්‍යතාවන් සට්ටනය වීමේ ඉඩකඩ පවත්නා පුපුරා යා හැකි ස්ථාන ගනනාවක් ම තිබේ.

20 වන සියවසේ ඉතිහාසය විමසා බලන විට පැහැදිලි වන්නේ දෙවන ලෝක සංග්‍රාමයෙන් පසුව පිහිටුවන ලද ඇමරිකානු සාමය (පැක්ස් ඇමරිකානා) ලෝක ධනේශ්වර පද්ධතිය දශක තුනක් පුරා පැවති කලබැගැනියෙන් පසුව ස්ථායීකරනය කිරීම සඳහා තීරනාත්මක වැදගත්කමක් ඉසිලූ බවයි. හිටපු සහ නැගී එන බලවතුන්ගේ අභියෝගයන් හමුවේ ඇමරිකානු ධනවාදය පරිහානිගතවීම, ජාත්‍යන්තර සම්බන්ධතාවන්ගේ වඩාත්ම පුපුරන සුලු සාධකය වන්නේය.

ලෝක ආර්ථිකයේ ආර්ථික ව්‍යුහයෙහි මූලික වෙනසක් සිදුව ඇත. 15 වසරකට පෙර ජී-7 ආර්ථිකයෝ ලෝක ආර්ථික ක්‍රියාකාරිත්වයේ සියයට 70 ආසන්න ප්‍රමානයකට (නාමික අගයෙන්) දායක වූහ. දැන් ඒවා දායක වන්නේ ආර්ථික ක්‍රියාකාරිත්වයෙන් සියයට 62 ට පමනි. පීපීපී (ක්‍රය ශක්තියේ සාම්‍යය ) පදනම මත නම් එය සියයට 43 පමනි.

දැන් අප පන්ති සමතුලිතය පිලිබඳ ප්‍රශ්නයට යොමුවෙමු.

මෙකල්හි සෑම දියුනු ධනපති ආර්ථිකයකම සමාජ ජීවිතයේ ප්‍රමුඛ ලක්ෂනය වන්නේ සමාජ අසමානතාවයේ වර්ධනය යි. සෙසු රටවලට වඩා වෙනස් නුවුව ද එක්සත් ජනපදයේ සංඛ්‍යාවන් වඩාත්ම ඇස් අරවන සුලුය. ඒවා ප්‍රකාශ කරන්නේ පොදු ක්‍රියාවලියකි.

ඩේවිඩ් නෝර්ත් එක්සත් ජනපදයේ සසප සමුලුවට ඉදිරිපත් කල වාර්තාවෙන් මෙසේ පෙන්වාදුනි. "බාර්ඩ් විද්‍යාලයේ ලෙවී ආර්ථික ආයතනයෙහි එඩ්වර්ඩ් එන් වුල්ෆ් මෑතකදී කල අධ්‍යයන වාර්තාවක් එක්සත් ජනපද සමාජ අසමානතාවේ ආන්තික මට්ටම් ගෙනහැර දක්වයි. ධනය බෙදීයාමට හා ආදායමට සම්බන්ධ සංඛ්‍යා ලේඛන, සමාජ ස්ථරායනයේ අසාමාන්‍ය පරිමාව පෙන්නුම් කරයි. ජනගහනයේ ඉහලම සියයට 1 එක්සත් ජනපද කුටුම්බයන් සතු ශුද්ධ වටිනාකමින් සියයට 34.3 ක් ද, ඊලඟ සියයට 4 සියයට 24.6 ද, ඊලඟ සියයට 5 සියයට 12.3 ද හිමිකර ගනියි. සියල්ල සැලකිල්ලට ගත්කල ජනගහනයේ පොහොසත්ම සියයට 10 කුටුම්බයන් සතු ජාතික ධනයෙන් සියයට 71 පමන හිමිකර ගනියි. ඊලග සියයට 10 ට අයත්වන්නේ සියයට 13.4 ක් පමනි. ඇමරිකානු කුටුම්බයන්ගේ පහල ම සියයට 80 හිමිකම් කියන්නේ ධනයෙන් සියයට 15.3 කට පමනි. ජනගහනයේ තුන්වන පහෙන් පංගුවට ලැබෙන්නේ යාන්තම් සියයට 3.8 ක් පමනි. කුටුම්භයන්ගේ පහල ම සියයට 40 ධනයෙන් හිමිකරගන්නා පංගුව සියයට 0.2 කි.

"ගෘහ වටිනාකම රහිත ධනය සැලකිල්ලට ගත්කල්හි, පන්ති බෙදීම තවත් විෂමය. කුටුම්බයන්ගේ ඉහල ම සියයට 1 එබඳු ධනයෙන් සියයට 42.2 ක් හිමිකර ගනියි. පහල ම සියයට 80 ට හිමිවන්නේ සියයට 7.5 ක ප්‍රමානයකි. ඉහල ම සියයට 10 සියයට 80 සමීප ප්‍රමානයකට හිමිකම් කියයි. දුප්පත්ම සියයට 40 හිමි ගෘහ අගය රහිත ධනයෙන් සියයට -1.1 කි.

"ආදායම් මිනුමට අනුව, ඉහලම සියයට 1 මුලු ආදායමෙන් සියයට 20 ක් හිමිකර ගනියි. ඉහල ම සියයට 10 සියයට 45 ක් ද පහල ම සියයට 80 සියයට 41.4 ක් ද ඉනුත් දුප්පත්ම සියයට 40 ආදායමෙන් යාන්තම් සියයට 10.1 න් ද හිමිකර ගනියි."

මෙම ක්‍රියාවලීන්ගේ වැදගත්කම පෙන්නුම් කරන තවත් සමහර සංඛ්‍යා මෙම අධ්‍යයනයෙහි අඩංගුවේ. මෙම සියවසේ ආරම්භක වසරවල කුටුම්බයන්ගේ නයගැතිකමෙහි පුපුරන සුලු වැඩිවීමක් අතිවිය. 2001-2004 දක්වා මධ්‍යම මට්ටමේ (ජනගහනයෙන් මැද කොටසේ කුටුම්බයන්හි ධනය ) ධනය සියයට 0.7කින් පහත වැටුනි. මීට පෙර මෙවැන්නක් සිදුව ඇත්තේ මහා අවපාත කාලයේදී ය. මුලු ධනයෙන් නිවසේ වටිනාකම අඩුකල පසු ජනගහනයෙන් මධ්‍යම මට්ටමේ කොටස සතු ධනය 2001-2004 අතර කාලයේ සියයට 27 න් පහත වැටුනි.

2000-2003 අතර කාලයේ මධ්‍යම මට්ටමේ ආදායම පමනක් සියයට 7 න් පහත වැටුනි.

වඩාත් දිගු කාලීනව සලකා බැලුවහොත්, දුප්පත්ම සියයට 40 සාමාන්‍ය ආදායම 1983 ත් 1984 ත් අතර සියයට 59 න් පහත වැටී තිබේ. ඒ කාලය තුලම ඉහලම සියයට 1 ශුද්ධ වටිනාකමේ මුලු වැඩිවීමෙන් සියයට 35 ද, නිවසේ වටිනාකම අත්හල පසු ධනයේ මුලු වර්ධනයෙන් සියයට 42 ද, ආදායමේ මුලු වර්ධනයෙන් සියයට 33 ද හිමිකරගෙන ඇත. ජනගහනයෙන් මැද පහෙන් පංගු තුනේ ධනයෙන් නය ආදායමේ පංගුව විශාල ලෙස වැඩිවී තිබේ. එය 2001-2004 දක්වා සියයට 100.3 සිට 141.2 දක්වා ද, වටිනාකමෙන් නයෙහි අනුපාතය සියයට 31.7 සිට 61.6 දක්වා දෙගුනයකින්ද වැඩිවී තිබේ.

ඇමරිකානු ආර්ථිකය මූල්‍යමය බවට පත්කිරීම - මෙය අනෙකුත් ප්‍රමුඛ ධනපති රටවල ද මේ අයුරින්ම ම ඇති කරුනකි - ඉහල ආදායම් සහිත ස්ථරයන් කරා ධනය මාරු කර යැවීමේ ප්‍රමුඛ යාන්ත්‍රනය බවට පත්ව තිබේ. මූල්‍ය ගනුදෙනු මගින් දැවැන්ත ලාභ රැස්කිරීම ද, වත්කම් අගය වැඩිකිරීම ද දල්වාලූ පහත් පොලී අනුපාතය හා නයෙහි ප්‍රසාරනය මත එය රැඳී තිබේ. අනෙක් අතට මෙම පහත් පොලී අනුපාතය පවත්වාගත හැකිවී ඇත්තේ චීනය හා අනෙකුත් අඩු වියදම් නිෂ්පාදකයන් ලෝක ධනේශ්වර වෙලඳපොලට ඒකාග්‍රවීමේ අවධමනකාරී බලපෑම මගින් පමනි.

එක්සත් ජනපදයේ රැකවරනය යටතේ ලෝකයේ සෑම කොනකට ම "නිදහස් වෙලඳපොලෙහි" අධිකාරය ව්‍යාප්ත කිරීමේ සෘජු ද්‍රව්‍යමය අවශ්‍යතාවයක් සහිත සමාජ බලවේගයක් ගොඩනැගී ඒම ද සමාජ අසමානතාවේ වර්ධනය ද යන මේ දෙකරුන අතර සම්බන්ධතාවය මෙයින් පැහැදිලි කෙරෙයි.

*සංහාරයෙන් පසු - බෝල්කන් යුද්ධයේ දේශපාලන පාඩම්* යන ලේඛනය තුල ඩේවිඩ් නෝර්ත් සාරාංශ ගතකල පරිදි අධිරාජ්‍යවාදයේ හා මිලිටරිවාදයේ උද්ගමනයෙන් කෙලින්ම වාසි ලබන ස්ථරයක් දියුනු ධනේශ්වර රටවල සිටියි. මෙම සමාජ බලවේගය බුෂ් පරිපාලනයේ නිමැවුමක් නොවේ. එහි මූලාරම්භය ඉන් එහාට දිවයයි.

1999 අප්‍රේල් මාසයේ සර්බියාවට බෝම්බ හෙලීමත් සමඟ ඇමරිකානු මිලිටරිවාදයේ ආර්ථික පදනම් කුමක් දැයි ජනාධිපති ක්ලින්ටන් ඉඟි කලේ මෙසේ යː "ලොව පුරාම අලෙවි කිරීමට හැකියාව ද සහිත ප්‍රබල ආර්ථික සම්බන්ධතාවක් ගොඩනගා ගැනීමට අප යන්නේ නම් යුරෝපය එයට යතුරක් වන්නේ ය. කොසෝවෝ ප්‍රශ්නයේ සුල මුල එය යි."

*නිව්යෝර්ක් ටයිම්ස් සඟරාවේ* විදේශ සම්බන්ධතා ලියුම්කරු වන තෝමස් ෆ්‍රීඩ්මාන් මෙය ඊටත් වඩා කෙලින් ප්‍රකාශ කලේය. ''වෙලඳපොලේ අදෘෂ්‍යමාන හස්තය කිසිවිටෙකත් සැඟවුන මුෂ්ටියක් නොමැතිව කටයුතු කරන්නේ නැත, මැක්ඩොනල්ඩ්ලාට (මැක් ඩොනල්ඩ් ආහාර වෙලෙන්දන්) මැක්ඩොනල්ඩ් ඩග්ලස්ලා (එෆ් 15 ප්‍රහාරක ජෙට් යානාව නිපදවන්නන්) නොමැතිව ඉසුරුමත් විය නොහැකිය. සිලිකන් නිම්නයේ තාක්ෂනය සඳහා ලෝකය සුරක්ෂිතව තබාගන්නා සැඟවුන මුෂ්ටිය නම් එක්සත් ජනපද මිලිටරිය, ගුවන් හමුදාව, නාවික හමුදාව හා මැරීන් බලකාය යි. ඇමරිකාව රැකවලෙහි නොයෙදෙතොත් ඇමරිකානු ලෝක තරනය ද (ඇමරිකා ඔන්ලයින්) නොපවතිනු ඇත. (*නිව්යෝර්ක් ටයිම්ස් සඟරාව* , 1999 මාර්තු 28 )

අප ගෙනහැර දැක්වූ වෛෂයික ක්‍රියාවලීන්ගේ වර්ධනය පන්ති ගැටුම් පැනනැඟීමේ හා කම්කරු පන්තියේ දේශපාලනික දිශානතියේ තීරනාත්මක චලනයක පදනම දමනු ඇත. සියලු ඓතිහාසික හා වෛෂයික දර්ශක විප්ලවවාදී අරගලයේ නව අවධියක පසුබිම සලකුනු කරයි.

මෙම වර්ධනයන් පැනනංවන අභියෝගවලට මුහුනදීම සඳහා දේශපාලනිකව සූදානම්වීම අපගේ කර්තව්‍යය යි. මෙම සූදානමේදී ප්‍රධාන වන්නේ කම්කරු පන්ති ව්‍යාපාරය අවමංගත කර, එහි විප්ලවවාදී දිශානතියේ වර්ධනය අවහිර කර හා ව්‍යාපාරය ආපසු ධනේශ්වරයේ අත යටට දැක්කීම සඳහා ක්‍රියාත්මක වන දෘෂ්ටිමය හා දේශපාලනික යාන්ත්‍රනයන් පැහැදිලි කිරීම හා හෙලිදරව් කිරීම ය.

දේශපාලන අර්ථශාස්ත්‍රය පිලිබඳ ක්ෂේත්‍රයේ සමහර ප්‍රවනතාවන් පිරික්සා බැලීමෙන් මෙම කරුනු දැක්වීම සමාප්ත කරමි.

ඩේවිඩ් හාවි නමැති ශාස්ත්‍රාලිකයා දේශපාලන අර්ථශාස්ත්‍රය පිලිබඳව කෘතීන් ගනනාවක් සම්පාදනය කර ඇත. ඔහුගේ රචනා වැදගත් අභිනිවේෂ අන්තර්ගත කර ගනී. පදයක් නැති තතු තුල "ශාස්ත්‍රාලීය මාක්ස්වාදය" යනුවෙන් හඳුන්වනු ලබන බොහෝ දේවල දී මෙන්ම මෙහි දී ද කම්කරු පන්තිය තුල මාක්ස්වාදය සඳහා අරගලයේ ඉතිහාසය මුලුමනින් ම වැරදි ලෙස අර්ථ කථනය කර හා විකෘති කර ඇත.

හාවි, *The New Imperialism* නව අධිරාජ්‍යවාදය නම් සිය කෘතිය තුල හාවි, චේතන කම්කරුවන් ඓතිහාසික පරිවර්තනයේ නියෝජිතයා ලෙස නිර්වචනය කරන මාක්ස්වාදී වාමාංශයේ " සම්භාව්‍ය දැක්ම" යයි ඔහු ම හඳුන්වන කාරනය විමසීමට ලක් කරයි. "කම්කරු පන්තිය ඓතිහාසික පරිවර්තනයේ අනුපමේය නියෝජිතයා ලෙස සලකන දෘෂ්ඨිය ස්ත්‍රීවාදය හා පරිසරවාදය වැනි සමාජ ව්‍යාපාර නොසලකාහරින අතර, මාක්ස්වාදී හා කොමියුනිස්ට්වාදී ආවේශය සහිත වාමාංශය කම්කරුපන්ති අරගලයෙන් පිටස්තර අන් සියල්ල

බැහැර කිරීමට මෙවන් ඒකායන අරමුනකින් එකතුවී සිටීම මාරාන්තික වැරැද්දකි.''( හාවි, *The New Imperialism,* නව අධිරාජ්‍යවාදය, ඔක්ස්ෆර්ඩ් යුනිවසිටි ප්‍රෙස් , 2004, 171 පිටුව )

හාවිගේ දෘෂ්ඨියට අනුව පශ්චාත් යුද කාලීන උත්පාතය අවසාන වීමෙන් පසුව සමාජවාදය මුහුනපෑ පරාජයන්ට වගකිව යුත්තේ මේ දේවල්ය. එහෙත් සැබෑ ගැටලුව පවත්නේ හාවි කියාසිටින තැන නොව, ගතවූ තිස්වසර පුරා ධනේශ්වරයේ ප්‍රහාරය සඳහා මඟ පෑදූ 1968-1975 දක්වා කාලය තුල අරගලයන් පාවාදීම හා කම්කරු ව්‍යාපාරයේ නායකත්වය තුලින්ය.

හාවිගේ විශ්ලේෂනයෙන් සිහියට නැඟෙන්නේ පූර්ව අවධියක හර්බට් මාකියුස් ය. ගෝලීය ධනපති නිෂ්පාදන ක්‍රියාවලිය කුමන කාර්යයක යෙදී සිටිය ද නිෂ්පාදන මාධ්‍යයන්ගේ අයිතියෙන් මුලුමනින් ම ඉවත් කරනු ලැබ සි වැටුප ම පමනක් ලබන්නා වූ පන්තිය වන කම්කරු පන්තියේ දැවැන්ත වර්ධනයක් ඇතිකර තිබෙන තැනෙහිදීම - හාවි අවධාරනය කරන්නේ නව සමාජ ව්‍යාපාර කරා යොමුවක් වර්ධනය කල යුතු බවය. කම්කරු පන්තිය වෙත හැරීම යන්නක් හාවි අදහස් කරන්නේ වටුප් ප්‍රශ්න මත වෘත්තීය සමිති අරගලය සමඟ සම්බන්ධ වීමයි. සත්තකින්ම සකල පීඩනයට ම එරෙහිව දේශපාලන අරගලයක පදනම මත පමනක් සමාජවාදී ව්‍යාපාරය වර්ධනය කල හැකි බව අවධාරනය කරන්නාවූ අව්‍යාජ මාක්ස්වාදය එවන් සංකල්පවලට සදාකල්හි ම විරුද්ධ වී ඇත.

"විප්ලවවාදී නායකයා ක්‍රියාකල යුත්තේ මහාජනතාවගේ අවශ්‍යතා සඳහා සටන් වදින්නෙකු ලෙස ය"යි ලෙනින් කල ප්‍රකාශය මෙහි දී සිහියට නැගෙයි. "කම්කරු පන්තියේ විමුක්තිය සඳහා අරගලයේ ලෝක ඓතිහාසික වැදගත්කම සෑම සියලු දෙනෙකුටම පැහැදිලි කර දීමේ අරමුනෙන් සිය සමාජවාදී විශ්වාසයන් හා ප්‍රජාතන්ත්‍රවාදී ඉල්ලීම්, ඒවා කොතෙක් සුලු වුවත්, සියලුදෙනා ඉදිරියේ තබා පැහැදිලි කිරීම සඳහා සෑම සිද්ධියක්ම උපයෝගී කර ගැනීමට" ඔහුට හැකි විය යුතුය. වෙනත් වචනවලින් කිවහොත් ධනවාදය හා මුලුමහත් පන්ති සමාජය විසින් මානව වර්ගයා මත පටවා ඇති සියලු ගැටලු විසඳීම ආරම්භ වන්නේ කම්කරු පන්තියට දේශපාලන බලය අල්ලාගැනීම මගින් පමනක්ය යන සංකල්පය මත සමාජවාදී ව්‍යාපාරය පදනම්ව පවතී.

එවන් අරගලයකට විකල්ප ලෙස හාවි යොජනා කරන්නේ කුමක්ද? මිලිටරිවාදය කරා වන තල්ලුව වනාහි එක්සත් ජනපදය විසින් සිය ගෝලීය ආධිපත්‍යය රැකගැනීම සඳහා දරන වියරු උත්සාහයක් බව සඳහන් කිරීමෙන් පසුව ඔහු මෙසේ ලියයි. ''තාවකාලිකව වුවත් ඕනෑම ධනේශ්වර නිෂ්පාදන ක්‍රමයක නීතිරීති ඇතුලත මෙම ගැටලුව සඳහා වන එකම ශක්‍ය විසඳුම වන්නේ කිසියම් ආකාරයක මුලුලොවට ම බලපෑහැකි වර්ගයේ නව සහන ප්‍රදානයකි. (නිව් ඩීල්)

මෙහි අර්ථය වන්නේ ප්‍රාග්ධන සංචලනය හා සමුච්ඡයේ තර්කනය එහි නව-ලිබරල් විලංගුවෙන් ගලවා ගනිමින්, රාජ්‍ය බලය වඩාත් මැදහත්කාරී හා යලි බෙදාහැරීමේ රේඛා ඔස්සේ නැවත සූත්‍රගත කරමින්, මාධ්‍ය තුලින් අප දකින අසන හා කියවන පරිදි ජාත්‍යන්තර වෙලඳමේ කොන්දේසිවලින් සියල්ලට අන පැනවීමට සමත් ප්‍රාග්ධනයේ සමපේක්ෂනාත්මක බලය මැඩපවත්වමින් හා කතිපයාධිකාරයේ හා ඒකාධිකාරයේ ඉහ වහාගිය බලය (විශේෂයෙන්ම මිලිටරි කර්මාන්ත සංකීර්නයේ සාපරාධී අධිකාරය) විමධ්‍යගත කිරීමෙන් හෝ ප්‍රජාතන්ත්‍රවාදී පාලනයකට යටත් කිරීමයි. ප්‍රතිපලය වනු ඇත්තේ වඩාත් පරාර්ථකාමී අධිරාජ්‍යවාදී "නව සහන ප්‍රදානයක් කරා ආපසු යෑමයි. බොහෝ කලකට පෙර කවුට්ස්කි සංකල්පනය කල පරිදි ධනේශ්වර බලවතුන්ගේ සභාගයක් වැනි දෙයක් හරහා මෙවැන්නකට අවතීර්න වීම වඩාත් යෝග්‍ය වේ." (ඬේවිඩ් හාවි, *The New Imperialism,* නව *අධිරාජ්‍යවාදය*, 209 පිටුව)

ඔහු තවදුරටත් මෙසේ කියයි. "සත්තකින්ම, වඩාත් රැඩිකල් විසඳුම් කඩා වදින්නට අවට රැක සිටී. එහෙත් එක්සත් ජනපදය හා යුරෝපය විසින් නායකත්වය දෙන 'නව සහන ප්‍රදානයක්,' ඉහවහා යන පන්ති බලවේගයන්ට ද එවැනි සහනයකට එරෙහිව යන විශේෂ ආසක්තතාවලට ද එරෙහිව දේශීයව හා ජාත්‍යන්තරව ගොඩනැඟීම සඳහා සටන් වැදීම වර්තමානයේ පවතින තත්වය තුල සහතිකෙන්ම සෑහෙන දෙයකි." (හාවි, 210-11 පිටු)

මූල්‍ය ප්‍රාග්ධනයේ හා "නිදහස් වෙලඳපොල" ධර්මයේ මංකොල්ලය නිසා ඊට එරෙහිව විවිධාකාර ආයාචනයන් නිර්මානය කර ඇත. එක් ලේඛකයෙකුගේ වචනවලට අනුව මෙය "දැඩි ස්ථාවරයක් ගැනීමට"ත් දෘෂ්‍යමාන හස්තයේ සම්ප්‍රාප්තිය ඉල්ලා සිටීමටත් කාලයයි. එහෙත් තවදුරටත් එය කලහැක්කේ ජාතික රාජ්‍ය මට්ටමේ නම් නොවේ - එය පැහැදිලිව ම නොසෑහේ අවශ්‍යවන්නේ ගෝලීය පරිමාව සැලසුම් කිරීමකි. "ගෝලීය සමාජ සම්මුතියක් පිහිටුවීමටත් සියල්ලන්ට ම සෑහෙන ඉඩකඩ සලසන ලෝකයක් ගොඩනැඟීමටත් වැඩ කිරීමට කාලය එළඹ ඇත. ජනතාවගේ ජීවිත සමඟ යලි ඒකාග්‍ර වන පරිදි වෙලඳපොල සම්බන්ධතාවන් පාලනය කිරීමටත් ප්‍රතිසංවිධානය කිරීමටත් දෘෂ්‍යමාන හස්තය ක්‍රියාත්මක කිරීම සඳහා ඓතිහාසික මොහොත දැන් එළඹ තිබේ." (විම් ඩියරක්සෙන්ස්, *The Limits of Capitalism* ධනවාදයේ සීමාවන් , සෙඩ් බුක්ස්, 2000, 126-27 පිටු )

ඇටැක් ව්‍යාපාරය සමඟ සම්බන්ධ ඩුමෙනිත් හා ලෙවි යන ප්‍රන්ස දේශපාලන අර්ථශාස්ත්‍රඥයන් දෙදෙනා මාක්ස් ගැන කුමක් සඳහන් කලත් ඔවුන්ගේ ප්‍රතිසංස්කරනවාදී දේශපාලන දිශානතිය නම් නිසැකව ම පැහැදිලිය. ඔවුන් අවධාරනය කර සිටින්නේ ද 20 වන සියවස අවසානයේ ධනේශ්වර අර්බුදය පිලිබඳ ඔවුන්ගේ විශ්ලේෂනයවන්නේ ද "කේනීසියානු රෝග විනිශ්චයේ නිරවද්‍යතාවය හා අර්ථභාරය යි; එනම් සාර්ව ආර්ථික තත්වය හා මූල්‍යායතන මත පාලනය, පුද්ගලයන්ගේ අතෙහි, එනම් මූල්‍ය බලය දරන අය අත, නොරැඳවිය යුතුය"යනුවෙනි.

ඔවුහු මෙසේ ද කියති. "වර්තමාන ගැටලුද ඇතුලත් ධනවාදයේ ඉතිහාසය පිලිබඳ කේනීසියානු දෘෂ්ටිය ඉතාම නැනවත්ය. අනෙකුත් සමාජ සන්ධානයන්ගේ සන්දර්භය තුලමෑත දශකයන්ගේ දේශපාලන තත්වයන් විසින් නව ලිබරල් ප්‍රහාරය වලක්වා ලූවේ - අර්බුදය කලමනාකරනය කිරීමේ වෙනත් මාර්ගයක් - හා විකල්ප ප්‍රතිපත්ති හඳුන්වා දීමේ හැකියාව, අත්කර දෙනු නොලැබීම ගැන යමෙකුට කල හැක්කේ පසුතැවීමට පමනි....

තවමත් විප්ලවවාදී අනාගතයක් ගැන සිහින මවන අය විසින් කේන්ස්ගේ ප්‍රතිසංස්කරනවාදය මුල්කොට ගෙන ඔහු හෙලාදැකිය යුතුද? කේන්ස්ගේ වැඩ කටයුතු සැබවින්ම ප්‍රතිසංස්කරනවාදීය. ඔහුගේ දීප්තිමත් ලෙස විවෘත එහෙත් සමාජීය වශයෙන් සීමිත පර්යා ලෝකය එසේ වුවද වඩාත් රැඩිකල් මාවතක් සඳහා එකම විකල්පය විය. අප දශක ගනනාවක් තිස්සේ දැන සිටි පරිදි සෑම තැනකදීම වැරදී ඇත. (ඩුමෙනිල් හා ලෙවී, *Capital Resurgent* ප්‍රාග්ධනයේ පිබිදීම, හාවර්ඩ් විශ්ව විද්‍යාල මුද්‍රනාලය, 2004, 201හා 204 පිටු)

සෝෂලිස්ට් රෙජිස්ටර් *Socialist Register* සමඟ සහයෝගී වූ යෝර්ක් විශ්ව විද්‍යාලයේ පැනිච් හා ගින්ඩින් වැනි අනෙක් අය කියාසිටින්නේ ඇමරිකානු අධිරාජ්‍යවාදයට පරිහානියකට මුහුනපානවා වෙනුවට ලෝක ධනේශ්වර පර්යායේ අර්බුදය පාලනය කර, දරාගැනීමේ හැකියාව ඇති බවය. ඔවුහු මෙසේ ලියති. "චීනයේ, උතුරු ඇමරිකාවේ හා අනෙක් සෑම තැනකදීම සමාජවාදීන්ට ඉතිරිව ඇති ප්‍රධාන ප්‍රශ්නය නම් ධනවාදය ප්‍රතිවර්තනය කිරීමට සමත් ප්‍රතිරෝධයන් වර්ධනය කරගන්නේ කෙසේද යන්නය." මෙම න්‍යායපත්‍රයෙන් එය පෙරලා දැමීමේ සටන නම් පැහැදිලිව ම න්‍යාය පත්‍රයෙන් ඉවත්ය.

රැඩිකල් කැනේඩියානු කතුවරියක් වන නයෝමි ක්ලේන් *The Shock Doctrine* කම්පනයේ ධර්මය නමැති ඇගේ නවතම කෘතිය වනාහි "නිල කතන්තරයේ මූලික හා වඩාත් ඇලුම්කල කියාපෑම් වලට එනම් බන්ධනවලින් නිදහස ලත් වෙලඳපොලවල් ප්‍රජාතන්ත්‍රවාදය සමඟ අතිනත් ගෙන ගමන් කිරීම නිදහසෙන් උපත ලැබූ නීතිරීති ඉවත් කල ධනවාදයේ ජයග්‍රහනයට අභියෝගයක් යයි කියන්නී ය. ඒ වෙනුවට ඇය මෙසේ තර්ක කරයි. "නිදහස් වෙලඳපොලේ" දක්ෂිනාංශික අර්ථශාස්ත්‍රඥ මිල්ටන් ෆ්‍රීඩ්මාන් හා ඊනියා චිකාගෝ ගුරුකුලය විසින් උත්කර්ෂයට නංවන ලද " ධනවාදයේ මූලධර්මවාදී ආකෘතිය"ට වින්නඹුකම කලේ, සාමූහික දේශපාලන දේහකාය මත මෙන්ම නිමක් නැති පුද්ගල ආයතන මතද පටවන ලද බලහත්කාරයේ අතිශය කුරිරු රූපාකාරයන් මඟිනි. (නයෝමි ක්ලේන්, *The Shock Doctrine* කම්පනයේ ධර්මය, පෙන්ගුයින් 2007, 18 පිටුව)

එහෙත් ක්ලේන් අවධාරනය කරන්නේ " වෙලඳපොල සමාජයේ සියලු ආකෘතීන් අනිවාර්යයෙන්ම ප්‍රචන්ඩ වේ යයි" තමා තර්ක නොකරන බවය. ඇය මෙසේ ලියයි. "ඒසා කුරිරු බවක් හා එවන් දෘෂ්ටිමය නිර්මලත්වයක් අවශ්‍ය නොකරන වෙලඳපොල පදනම් කරගත් ආර්ථිකයක් සඳහා පැහැදිලි ලෙසම හැකියාව තිබේ." නිදහස් පොදු සෞඛ්‍ය පහසුකම් හා පොදු පාසැල් ද, ආර්ථිකයේ විශාල කොටසක් රාජ්‍ය අතෙහි රැඳී ඇති, යෝග්‍ය වේතන හා වෘත්තීය සමිති අයිතීන්ට ගරු කිරීමට සමාගම්වලට බලකෙරෙන නීති අවශ්‍ය කෙරෙන හා තියුනු අසමානතාවය ලිහිල් කිරීමට ධනය යලි බෙදාහැරීම සමග එකට පාරිභෝගික නිෂ්පාදිතයේ නිදහස් වෙලඳපොලක් ද පැවතිය හැකිය.

"මහා අවපාතයෙන් පසුව කේන්ස් යෝජනා කලේ හරියට ම ඒ වර්ගයේ මිශ්‍ර, පරිපාලිත ආර්ථිකයකි. ඒ අනුව නිර්මානය කල 'නව සහන ප්‍රදානය' ලොව වටාම ඒ හා සමාන පරිවර්තනයන් ඇතිකර, රාජ්‍ය ප්‍රතිපත්තිය විප්ලවයකට බඳුන් කලේය. ෆ්‍රීඩ්මාන්ගේ ප්‍රති විප්ලවය දියත් කලේ, සම්මුතීන්, ආරක්ෂක විධි විධාන, වලින් සමන්විත හරිටම එම පද්ධතිය රටක් රටක් පාසා ක්‍රමානුකූලව සීසීකඩ කර දැමීම සඳහාය." (ක්ලේන්, 20 පිටුව)

ඇගේ ග්‍රන්ථය ගැන පැවති සම්මුඛ සාකච්ඡාවකදී, කේනීසියානු "මිශ්‍ර ආර්ථිකය" තමා සඳහා පෙනී සිටින්නේ "යථාර්තවාදීනියක" වන බැවින් යයි ක්ලේන් පැහැදිලි කලාය.

එහෙත් ඉතිහාසයේ රිය සක ආපසු හැරවිය හැකිවූ පශ්චාත් යුද කාලීන උත්පාතයේ 21 වන සියවසෙහි සංස්කරනයක් යලි සොයාගත හැකි ය යන මතය තරම් අයථාර්ථී තවත් යමක් තිබිය නොහැකිය.

පලමු කොට ම, එවන් යෝජනාවක් සඳහා උපදෙස් දෙන අය අමතක කරන්නේ උත්පාතය කේනීසියානු ප්‍රතිපත්ති කරනකොට ගෙන පැන නොනැගි බව හා එය ලෝක ධනවාදයේ ව්‍යුහය තුල

ඇතිවූ දැවැන්ත වෙනස්කම සමග බැඳී තිබුන බවය. අවම වශයෙන් එය දෙවන ලෝක සංග්‍රාමය මගින් පන්නර ගැන්වූ ප්‍රචන්ඩත්වයේ හා විනාශයේ ප්‍රතිඵලය විය. වෛෂයික ක්‍රියාවලීන්ගේ ප්‍රතිඵලයක් ලෙස උත්පාතයේ බිඳවැටීම සමග, පසුව හටගත්තාවූ අර්බුදය දුරලීමට කේනීසියානු විසඳුම්වලට හැකිවූයේ නැත. සමහර ක්‍රම අර්බුදය උග්‍ර කර එ මගින් කම්කරුවන්ගේ ව්‍යාපාරයට එරෙහිව ප්‍රහාරය සඳහා මධ්‍යම පන්තියේ කොටස් අතර සමාජ පදනමක් සම්පාදනය කර දුනි.

දෙවනුව, ක්ලේන් හා කේනීසියානුවාදයේ අනෙකුත් උපදේශකයන් යෝජනා කල මාවත් ඔස්සේ සමාජ ප්‍රතිසංස්කරන සඳහා සැලකිය යුතු ව්‍යාපාරයක් වර්ධනය වූයේ නම් පවා, එය ක්ෂනිකවම තම ආසක්තයන් රැකගැනීම සඳහා සියලු පියවර ගැනීමට අදිටන් කර සිටි පැලපදියම් වූ පාලක පැලැන්තියක් සමග හැප්පෙනු ඇත. එවන් ප්‍රතිපත්තීන් යෝජනා කරන්නෝ, ධනේශ්වර පර්යායට එරෙහිව දේශපාලන අරගලයක් තුල කම්කරු පන්තිය බලමුලු ගැන්වීමට හා මෙම ඉදිරිදර්ශනයේ පදනම මත සමාජ විඥානය ඉහල නැංවීම සඳහා ඒකායන සටනට උර දී සිටින මාක්ස්වාදීන්ට එරෙහිව තමන් යථාර්තවාදීන් යයි කියා ගනිති.

වසර 150 කටත් පෙර මාක්ස් විසින් විවේචනය කරන ලද රැඩිකල්වාදීන්ට සමාන ක්‍රියා පිලිවෙතක් සැබවින්ම ඔවුහු අනුගමනය කරති. ඔවුන් වෛෂයික සන්තතීන් හා වර්ධනයන් විභාග කර ඉන් අවශ්‍ය දේශපාලන ක්‍රියාමාර්ගය උකහාගන්නවා වෙනුවට, ඔවුන් සඳහා වඩාත් සුවදායී හා වඩාත් වාසි සහගත පියවර මාලාවක් ගෙනහැර දක්වමින් මෙම යෝජනා සර්වලෝක විසඳුමක් යයි කියා සිටිති.

ලෝක සමාජවාදී විප්ලවයේ ඉදිරිදර්ශනය හා ලෝක ආර්ථිකය ප්‍රතිසංවිධානය කිරීම කිසියම් ඈත ඉදිරිදර්ශනයක් නොවේ. වෛෂයික ආර්ථික ක්‍රියාවලීන්ගේ හා ප්‍රවනතාවන්ගේ තර්කනය විභාග කර බැලීමේදී පෙනීයන්නේ කම්කරු පන්තියට හා මානව සමූහයාට ගෝලීය ධනේශ්වර පර්යායේ ගැඹුරුවන අර්බුදය හා ඉන් ඇතිකරන විනාශයන්ට මුහුන දිය හැකි එකම ශක්‍ය පදනම එය බවයි. එලඹෙන දින 5 පුරා අපගේ කර්තව්‍ය වන්නේ මෙම අරගලය පෙරට ගෙනයාම සඳහා අවශ්‍ය කෙරෙන දේශපාලන විඥ්ඥානය වර්ධනය කිරීම සඳහා වැදගත් වන න්‍යායික හා දේශපාලන පැහැදිලිකම අත්කර ගැනීමයි.

**සමාප්තයි.**

© www.wsws.org